# රටටම එළවළු ඇට දෙන බීජ මධ්‍යස්ථානය

ප්‍රවෘත්ති ප්‍රකාශන නිලධාරි යසසිරි ජනක කුමාර විසිනි.

පාත්ති හදලා ඉවරයි. ඒත් කවම එළවළු ඇට ටිකක් හොයාගන්න බැරි වුනා. මේ ගමන නම් දෙපාර්තමේන්තුවේ ඇට තමයි තවාන් දමන්නේ. ගිය ගමන පැලවලින් සත පහක වැඩක් නැහැ. ගෙවතු වගා නැත්නම් හොඳ එළවළු කොටු තියෙන අපේ ගොවි මහත්තුරු නිතර දෙවේලේ මෙහෙම කියනවා ඔබටත් ඇහිලා ඇති.



ගොවිපලේ බෝග පරීක්ෂා කරන
කුමාරසිංහ මහතා

ඉස්සර නම් ගෙවත්තක මිරිස් පාත්තියක්, වම්බටු පැල ටිකක්, කරවිල වැල්, මාළු මිරිස් ටිකක් හදගන්න මෙච්චර ලක ලෑස්ති වෙනවයැ. තියෙන තැනකින් පැල ටිකක් නැත්නම් එළවළුවට ගෙනාපු කරල් ටිකක් වේලලා ඇට ගන්නවා. ඒත් දැන් එහෙම නැහැ. දෙපාර්තමේන්තුවේ ඇටම යි හොයන්නේ. මේවා බටඅත පාම් එකේ නැත්නම් පැල්වෙහෙර, මහඉලුප්පල්ලම බඩු කියලා තැන් තැන්වල එළවළු ඇට විකුණනවා ඔබත් දැකලා ඇති.

ගොවි මහත්තුරු දෙපාර්තමේන්තුවේ එළවළු ඇටම ඉල්ලන්නේ ඇයි කියලා බලන්න අපටත් හිතුණා. ගෙවතු වගා මධ්‍යස්ථානයට ගියාම හරි විස්තර ගන්න නම් ගන්නොරුවට යන්න කිව්වා. අපි ගන්නොරුවට ගියා, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මධ්‍යම එළවළු බීජ මධ්‍යස්ථානයට. ගෙවතු වගා මධ්‍යස්ථානයක දී නැතිනම් පළාතේ කෘෂිකර්ම ව්‍යාප්ති කාර්යාලයේදී එහෙම නැත්නම් සතියේ පොලක දී ඔබට එළවළු ඇට දෙන්න ඔවුන් ගන්නා වෑයමේ තරම් වැටහුනේ එතෙන්දි.

අඩු තරමින් අවුරුද්දකට එළවළු ඇට රාත්තල් විසිදහක් විතර ඕන කරනවා. බීජ මධ්‍යස්ථානය මේ වගකීම ඉටු කරන්නේ ගොවිපලවල් විස්සක හා පෞද්ගලික එළවළු ඇට නිෂ්පාදකයන් ගේ උදව්වෙන්. බටඅත, මහඉලුප්පල්ලම, රහන්ගල, පැල්වෙහෙර, නවයාලතැන්න වගේ දෙපාර්තමේන්තුවේ ගොවිපලවල් මේ සඳහා ම වෙන්වූ ඒවා ලෙස දක්වීම වඩා නිවැරදි යි.

අපි ගන්නෝරුවෙන් කටුගස්තොට නවයාලතැන්න ගොවිපලට ගියා. දේශීය එළවළු ඇට විතරයි එතැන නිෂ්පාදනය කරන්නේ. ගොවිපල කළමණාකරු කුමාරසිංහ මහත්තයාට මහ කන්නයට හොඳ ඇණවුමක් ලැබිලා ගන්නෝරුවෙන්. නිවිති ඇට රා. 250 ක්, හවරි මෑ 350, දඹල 50, බටු රාත්තල් 1,000 ක් මාළු මිරිස් රා. 350 ක් හා තක්කාලි ඇට රාත්තල් 250 ක් එයාලා ගන්නොරුවට හදලා බාර දෙන්න ඕනේ. මේක කරන්නේ කොහොමද? අපි ඇහුවා.

නවයාලතැන්න 1947 පටන් ගත්ත ගොවිපලක්. අවුරුදු දෙක තුනකට කලින් මේක

වහලා දැම්මා. මේ ළඟදියි ආපසු මෙතැන එළවළු ඇට ගොවිපල පටන් ගත්තේ. අක්කර 42 ක් තියෙනවා. තිස්හතක් වගාවට ගන්නවා. අපිට අත්තිවාරම් බීජ නැත් නම්- වගාව පටන් ගන්න බීජ දෙන්නේ ගන්නොරුවෙන්. අපි ඒවායින් තමයි තවාන් හදලා පාත්ති දමන්නේ. ඔය කලින් කියපු ජාති. කුමාරසිංහ මහත්තයා විස්තරය පටන් ගත්තා. එක පවුලේ එළවළු වර්ග පාත්ති අපි එක ළඟ දමන්නේ නැහැ. පිරිසිදු, කලවම් නොවුන එළවළු ඇට ගැනීමයි අපේ මූලික කටයුත්ත. ඒ නිසයි එහෙම ළඟින් නොදමන්නේ. දැන් මිරිස් ගත්තොත් යාර 100 ක් ඇතුළත මිරිස් ජාති දෙකක පාත්ති දමන්නේ නැහැ. පරපරාගනය නිසා බෝගය කලවම් වෙන්න පුළුවන්. වෙනත් එකම පවුලේ බෝගවලටත් එහෙම තමයි.



සොප් අක්කා මේ තෙලන්නේ 'නිවිති' ඇටයි.

එළවළුවල මල් පලගත්තාම අපි ගන්නොරුව එළවළු බීජ කෘෂිකර්ම නිලධාරි තැනට දන්වන්න ඕන. එයා ඇවිත් හැම පාත්තියක් ම පරීක්ෂා කරලා එළවළු බීජ ගැනීමට සුදුසු තත්ත්වයක් ඒවායේ තියෙනවාද කියලා බලනවා. ආයේමත් කරල් හැදුනාම ඇවිත් බලනවා. එත්කොට තමයි ස්ථිරවම එළවළු ඇට ගන්න සුදුසු ද කියලා තිරණය කරන්නේ.

> **පැහුන තක්කාලි රාත්තල් සියකින් ඇට අවුන්ස දෙකකට වැඩිය ගන්න බැහැ. යලට මහට රටටම එළවළු ඇට රාත්තල් විසිදහක් විතර ඕන. බීජ මධ්‍යස්ථානයට පැවරිලා තියෙන්නේ මෙම කට යුත්ත ඉටු කිරිමයි.**

කරල හොඳට පැහුනාම හොඳට වේලෙන්න අරිනවා. ඊට පස්සේ ඇට වෙන් කරන් ඒවාත් හොඳට වේල ගන්නවා. අපිරිසිදු දේවල්, විකෘති ඇට, කෝරලා බේරලා අයින් කරනවා. ඇට ලබා ගැනීම ඉතාමත් පිරිසිදුව කරන්න ඕන. ඒක තමයි ඉතාම වැදගත්. පැසුණු තක්කාලි රාත්තල් සියකින් ඇට අවුන්ස දෙකකට වැඩිය ගන්න බැහැ. වේලිච්ච මිරිස් රාත්තල් පහකින් බීජ ඇට රාත්තලක් විතර ගන්න පුළුවන්. මේ දෙකින් තේරෙනවා නේද අපිට දීලා තියෙන ඇණවුමක් ඉටුකරන්න දරන්න ඕන වෑයම.

ඊට පස්සේ මේ එක එක ඇට ජාති ජාතිවලින් සැම්පල් නැත්නම් නියැදි අරන් ගන්නොරුවේ බීජ පරීක්ෂණාගාරයට යවනවා. අනික් එක හැම නෙලන දිනකටම නියැදි අරන් තියනවා. එකම පාත්තියක කියල ගන්නවාට අරන් බැහැ. නෙලන දින අනුව යි නියැදි ගන්නේ. එයාලගෙ පරීක්ෂණ වාර්තාවට අනුව නියැදි ඇට හොඳ ඒවා නම් ඉතිරි තොගය ගන්නොරුව බීජ ගබඩාවට අරිනවා. නැත්නම් ඉතින් අහක.

වැඩ තියෙන කාලෙට සියක් විතර දින පතා මෙහේ වැඩ. අපේ මූලික කටයුත්ත එළවළු ඇට ගන්න එළවළු වවන එකයි. සුළු ප්‍රමාණයක් මහජනතාවට විකිණීමටත් එළවළු වවනවා. පරීක්ෂණ වාර්තාවට අනුව ඇට බාර දුන්නම අපේ කොටස ඉවරයි. ඇත්තටම එළවළු ඇට නියැදිය ගන්නොරුවට ගිය මොහොතේ ඉඳලා වැඩ තියෙන්නේ එතන. එහේ දී ඉතුරු විස්තර කියයිනේ, කුමාරසිංහ මහත්තයා ගෙන් සමු අරන් අපි ආයේ ම ගන්නොරුවට ආවා.

කෘෂිකර්ම උපදේශක සෙල්වකුමාර් මහතා බීජ පරීක්ෂණාගාරයේ කතාව අපිට කිව්වා. උසස් තත්ත්වයේ බීජ නිපදවීම ඉතා වැදගත්.

මොකද දැන් වැඩි අස්වනු ගන්න දියුණු කළ බෝග වර්ගවල බීජ උසස් තත්ත්වය කින් වගා කරන්න ඕන. ඉතින් වගාවන් සඳහා හදන බීජ උසස් තත්ත්වයේ ඒවා ද කියලා විද්‍යාත්මකව පරීක්ෂා කිරීම තමා අපේ කාරිය ඔහු කිව්වා. මෙතැන සේවය වැඩිපුරම බිත්තර වී පරීක්ෂණයටයි කැප වෙන්නේ. එළවළු හා අතිරේක බෝග බීජත් අපි පරීක්ෂා කරනවා.

අපට ලැබෙන සෑම නියැදියකටම අංක යක් දීලා, ඒ පිළිබඳ සියළු තොරතුරු ලියා ගන්නවා. ඊට පස්සේ ඒ බීජ නියැදිය තෙතමනය, ප්‍රරෝහනය හා ප්‍රරෝහන ශක්



**පරීක්ෂාවට ලක්වෙන සලාද පැල**

තිය හා ප්‍රාණවත් බව පිළිබඳ පරීක්ෂාවන්ට ලක් කරනවා. ප්‍රරෝහණ බීජයක් අප්‍රාණික ද ප්‍රාණවත් ද යන්න සොයා ගත හැකි යි. බීජයක ජීව්‍ය තත්ත්වය ප්‍රාණවත් බව පිළිබඳ පරීක්ෂණ වලින් හෙළි වන බව ද ඔහු කිව්වා. ඇතැම් බීජ ප්‍රාණවත් වුනත් ඉන් හැදෙන පැලය හෝ ගස මනාව නොවැඩෙන හොඳ පලදාවක් නොලැබෙන එකක් වෙන්න පුළුවන්. වැඩි ප්‍රාණවත් බවක් නැති බීජ වලින් තමයි මෙහෙම වෙන්නේ. මනා ප්‍රාණවත් බවක් ඇති බීජ අනාගතයේ කදිම අස්වැන්නක් දෙන හොඳ පැල හෝ ගස් වෙනවා.

ඇතැම් බීජ ස්වභාවයෙන් නැතිනම් උප තින් ම මනා ප්‍රාණවත් බවක ලබනවා. සමහර ඒවා උපතින් දුර්වල ඒවා. ඒවාට අපිට කරන්න පුළුවන් දෙයක් නැහැ. ඒත්

**මනා ප්‍රාණවත් බවක් ඇති බීජ අනාගතයේ කදිම අස්වැන්නක් දෙන ගස් හෝ වැල් වෙනවා. වැඩි අස්වනු ගන්න මෙවැනි බීජ උසස් තත්වයකින් වගා කිරීම ඉතා වැදගත් වෙනවා.**

පරිසරාත්මක හේතු නිසා ප්‍රාණවත් බවට වන බලපෑම් අපට වලක්වා ගන්න පුළුවන්. බෝග කරල් හෝ ගෙඩි හොඳින් වැඩී මෝරා ඇති විට ප්‍රාණවත් බව වැඩියි. මෙහෙම මෝරන්න පෙර කඩන කරල් හෝ ගෙඩි බීජවල ප්‍රාණවත් බව අඩු යි. කාල ගුණය, රෝග හා පලිබෝධ උවදුරු වලට ලක් වෙන්නේ මේ කාලය අතරතුර යි. බෝග නෙලන විට හා පොතු හරින විටත් බීජවලට අනතුරු වෙන්න පුළුවන්. නෙලූ විගසම ඒවා වේලීම ප්‍රාණවත් බව රැක ගැනීමට හුඟාක් උදව් වෙනවා. ඒත් තෙත බෝග එක්වරටම දැඩි උෂ්ණත්වයක් යටතේ වේලීම හොඳ නැහැ. ඒකත් බීජ වලට හානිදයක යි. උෂ්ණත්වය වැඩි කළයුත්තේ ක්‍රමානුකූලව යි.

මෙම පරීක්ෂණ කරන්න උපකාරී වන එමෙන් ම අවශ්‍ය උෂ්ණත්ව පවත්වා ගත හැකි උපකරණ හා පහසුකම් පරීක්ෂණාගාරයේ තියෙනවා. මෙතැන වැඩ පටන් ගත්තේ 1958 ජුලි වල. සෙල්වකුමාර් මහතා ඉතිහාසය ටිකක් මතක් කළා. 1959 දී නියැදි 3354 ක් පරීක්ෂා කරලා වාර්තා දුන්නා. එතකොට පරීක්ෂා කලේ වී විතරයි. 1968 දී තමයි එළවළු ඇට පරීක්ෂා කිරීම පටන් ගත්තේ. මේ කාලෙත් වැඩිපුරම එළවළු ඇට පිටරටින් ගෙනාවේ. 1975 දී අපි වී සහ එළවළු නියැදි 29,984 ක් පරීක්ෂා කර වාර්තා දීලා තියෙනවා.

ඔය වගේ බාර දෙන නියැදියක් පිළිබඳ අපේ පරීක්ෂණ වාර්තාවේ පිටපතක් නියැදිය එවූ ගොවිපලට හෝ පුද්ගලයන්ට යවනවා. එකක් අපි තියා ගන්නවා. අනික් එක මධ්‍යම බීජ මධ්‍යස්ථානයට යවනවා. අපේ වාර්තාව



**විකෘති ඇට ඉවත් කරද්දී**

ලැබුණ විගසම එළවළු ඇට පිළිබඳව කඩිනම් වෙන්නේ බීජ මධ්‍යස්ථානය යි. එතැනට ගියාම ඉතුරු හරිය දූන ගන්න බැරි යැයි සෙල්වකුමාර් මහතා අපෙන් සමු ගත්තා.

දූන් අනිත් දෙපලෙන් කෙරෙන දේවල් දන්නවානේ. බස්නායක මහත්තයා බීජ මධ්‍යස්ථානයේ දි අපට හමුවුනා. දූන් ඔය නවයාලතැන්න වගේ අනෙකුත් දිවයින පුරා තියෙන එළවළු ඇට ගොවිපල වලටත් අපේ සහතික කිරීමේ නිලධාරීන් යනවා. නැතිනම් කාට හරි හිතෙන්න පුළුවන් ළඟ තියෙන හින්ද නවයාලතැන්නට විතරයි එහෙම යන්නේ කියලා,

## රට එළවළු

**ඇත්තටම තවමත් උඩරට එළවළු ඒ කිව්වේ කැරට්, බීට්රූට්, ගෝවා, ලීක්ස්, වගේ එළවළු බීජ ඇට රටින් ගෙන්වනවා. ඒක මෙහේ කරනවාට පහසුයි ලාබයි. අවුරුද්දකට ලක්ෂ විස්සක් විතර යනවා. රටින් ගෙන්වන එළවළු බීජ කෙළින් ම සීතාඑළිය ගොවිපලට යවනවා. එතැනින් තමයි පරීක්ෂණ පවත්වලා ඒවා අවශ්‍ය අයට බෙදලා දීමට කටයුතු කරන්නේ. අනෙක් සේරම එළවළු බීජ ඇට නියැදි පිළිබඳ පරීක්ෂණ වාර්තා පිටපත් ලැබුණත් එක්කම අපි වැඩට බහිනවා.**

නියැදි වාර්තාව හොඳ නම් ඊට අදාල එළවළු ඇට තොගය කෙළින් ම මෙහාට ගෙන්වනවා. ඒවා හොඳට පිරිසිදු කරලා සකස් කරලා පැකට් කරන්නේ මෙහේ දී. ඊට පස්සේ ඒවා අපේ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන් 23 දෙනාට දෙනවා. අපේ ගෙවතු වගා මධ්‍යස්ථානවලට, ගොවි යෝජනා ක්‍රමවලට, ජනාවාසවලට, හා පලදාවර්ධන කමිටුවලට බෙදා දෙනවා. ගොවි ජනතාවට එළවළු බීජ ඇට මේ තැන්වලින් ලබා ගන්න පුළුවන්. එළවළු ඇට ගබඩා කරලා තියා ගන්න එකත් ඉතාම ප්‍රවේසමින් දැඩි අවධානයකින් කරන එකක්. නැත්නම් මහ කලබැගෑනියක් වෙන්නේ. දැඩිම උනුසුමත් දැඩි තෙතමනයත් දෙකම හොඳ නැහැ. නියමිත උෂ්ණත්ව ප්‍රමාණ තියෙනවා. කෘමි උවදුරු වගේ දේවලුත්. ඔය සේරගෙන් ම බීජ ටික රැක ගන්න ඕන.

## බෝංචි බීජ

රජයේ ගොවිපලවලට ම මේ කටයුත්ත කරන්න අමාරුයි. පෞද්ගලික ගොවි මහත්තුරුත් මේකට අතදෙනවා නම් හොඳයි. ඒත් එච්චර ලාබ ගෙන දෙන දෙයක් නොවෙයි නේ. ඒක නිසා එයාලා එතරම් උනන්දු නැහැ. හැබැයි වතුවලින් නම් අපිට ටිකක් සහයෝගයක් තියෙනවා. බස්නායක මහතා සිනාමුසුව කීය. දූන් නුවරඑළිය, බදුල්ල වගේ පැතිවල තේ වතු අධිකාරීන් බෝංචි බීජ හදන්න උනන්දු වෙනවා. කබරගල වත්තේ අක්කර 72 ක් ම. ඔක්කොම අක්කර 500 ක් විතර එයාලා යොදවලා. මේවා හුඟක් සාර්ථකව කරන ඒවා. අපේ උපදේශක මහත්තුරු හුඟාක් උදව් වෙනවා.

ගොවිපල කටයුතු, බීජ පරීක්ෂණාගාරයේ සේවය ආදිය සංවිධානය කරලා. යලට මහට ඕන කරන එළවළු බීජ අඩු නොවෙන්න සපයන එකයි බීජ මධ්‍යස්ථානයේ වගකීම. මම හිතන්නේ අපිට තියෙන පහසුකම් යටතේ සාර්ථක සේවාවක් අපි කරනවා කියලයි. ඒ නිසා අනාගතය අසාර්ථක වෙන්න බැහැනේද? බස්නායක මහතා අවසාන වශයෙන් කීවා.